# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2183/34 – 2020 ජූලි 09 වැනි බ්‍රහස්පතින්දා – 2020.07.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/10/58/2013.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2016.01.25 වැනි දින අංක 1951/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.01.21 වැනි දින දරන නියෝගයෙන්,

එච්. ජයතුංග මයා., අංක 361/1/23, ඉසුරු උයන, පහළ කොස්ගම, කොස්ගම.

සහ

නැෂනල් පේපර් කොම්පැනි ලිමිටඩ්, අංක 93, ජාවත්ත පාර, කොළඹ 05.

අතර පවත්නා 2015.12.28 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් සුගතදාස කාරියවසම් මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2016.01.21 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය.

2020 මාර්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

07 – 619/1

මගේ අංකය: IR/10/58/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එච්. ජයතුංග මයා., අංක 361/1/23, ඉසුරු උයන, පහළ කොස්ගම, කොස්ගම.

සහ

නැෂනල් පේපර් කොම්පැනි ලිමිටඩ්, අංක 93, ජාවත්ත පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පිලියන්දල, කැස්බෑව, සර්වෝදය මාවත, අංක 13/30, සරත් ලියනගේ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය.

2020 මාර්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/58/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එච්. ජයතුංග මයා., අංක 361/1/23, ඉසුරු උයන, පහළ කොස්ගම, කොස්ගම.

සහ

නැෂනල් පේපර් කොම්පැනි ලිමිටඩ්, අංක 93, ජාවත්ත පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,**

''නැෂනල් පේපර් කොම්පැනි ලිමිටඩ් ආයතනය මගින් නිකුත් කරන ලද 2005.07.01 දිනැති චක්‍රලේඛ අංක 475.84/05/VR අනුව, එම ආයතනයේ ඇඹිලිපිටිය කඩදාසි කම්හලේ සේවය කළ එච්. ජයතුංග මහතා ස්වෙච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය යටතේ 2005.09.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්වෙච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීම පිළිගැනීම මත, එච්. ජයතුංග මහතාට වන්දි මුදලක් ලබාදෙන ලෙසට කරනු ලබන ඉල්ලීම යුක්තිසහගතද? යන්න හා එලෙස යුක්තිසහගත වන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 – 619/2

මගේ අංකය: IR/COM/03/2018/293.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ඩබ්. ටී. කීර්ති පෙරේරා මයා., අංක 49, පහල ඉඹුල්ගොඩ, ඉඹුල්ගොඩ.

සහ

දුල්මිණි එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 365, ඩැම් වීදිය, කොළඹ 12.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 06, පොල්හේන්ගොඩ, එඩ්මන්ටන් නිවාස, අංක XB–10-1-2, ඩී. ජී. කේ. කරුණාරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය.

2020 අප්‍රේල් මස 20 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2018/293.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඩබ්. ටී. කීර්ති පෙරේරා මයා., අංක 49, පහල ඉඹුල්ගොඩ, ඉඹුල්ගොඩ.

සහ

දුල්මිණි එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 365, ඩැම් වීදිය, කොළඹ 12.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,**

''ලංකා ප්‍රින්සස් හෝටලය (Lanka Princess Hotel) යන නමින් ක්‍රියාත්මක වන දුල්මිණි එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් (Dulmini Enterprises (Private) Limited) හි සේවය කරන ඩබ්. ටී. කීර්ති පෙරේරා මහතාට 2018 වර්ෂයට අදාළ වැටුප් වර්ධක හා ප්‍රසාද දීමනා ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේද? අසාධාරණයක් සිදුව ඇත්නම් හිමිවිය යුතු සහන මොනවාද?'' යන්න පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 – 620

මගේ අංකය: IR/COM/02/2018/127.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

ලංකා කම්කරු රතු කොඩි සංගමය, අංක 496/12, පියාසෝ උද්‍යානය, පේරාදෙණිය පාර, මහනුවර.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

1. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, අංක 21, බී. සී. සී. පරිශ්‍රය, මිරානියා වීදිය, කොළඹ 12.
2. වතු අධිකාරී, හෙයාර් පාර්ක් වත්ත, හුන්නස්ගිරිය.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කටුගස්තොට, යටිවාවල, අරලිය උයන, ''මිගදාය'', අංක 339/01/ඩී/2, එල්. ආර්. සුමතිපාල මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය.

2020 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2018/127.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

ලංකා කම්කරු රතු කොඩි සංගමය, අංක 496/12, පියාසෝ උද්‍යානය, පේරාදෙණිය පාර, මහනුවර.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

1. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, අංක 21, බී. සී. සී. පරිශ්‍රය, මිරානියා වීදිය, කොළඹ 12.
2. වතු අධිකාරී, හෙයාර් පාර්ක් වත්ත, හුන්නස්ගිරිය.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් හුන්නස්ගිරිය හෙයාර් පාර්ක් වත්තේ සේවකයින්ට සාමූහික ගිවිසුම අනුව 2007 සිට 2019 දක්වා මසකට අවම වශයෙන් දින 25 ක් හෝ සේවය කිරීමට අවස්ථාව ලබා නොදීමෙන් එම සේවකයන්ට අසාධාරණයක් සිදුව තිබේ ද? අසාධාරණයක් සිදුව ඇත්නම් හිමිවිය යුතු සහන කවරේ ද?'' යන්න පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජනවාරි මස 31 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 – 621

මගේ අංකය: IR/COM/04/2018/229.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ජේ. ඩබ්. කේ. බණ්ඩාර මයා., අංක 175/F 6, ඇල්විටිගල මාවත, කොළඹ 08.

සහ

බොගවන්තලාව ටී එස්ටේට්ස් පීඑල්සී, අංක 153, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 05, ටොරින්ටන් මාවත, ටොරින්ටන් ෆ්ලැට්ස්, අංක K 77, පී. මහාදේව මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය.

2020 මාර්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2018/229.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ජේ. ඩබ්. කේ. බණ්ඩාර මයා., අංක 175/F 6, ඇල්විටිගල මාවත, කොළඹ 08.

සහ

බොගවන්තලාව ටී එස්ටේට්ස් පීඑල්සී, අංක 153, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,**

''බොගවන්තලාව ටී එස්ටේට්ස් පීඑල්සී ආයතනයේ සේවය කර ඇති ජේ. ඩබ්. කේ. බණ්ඩාර මහතාට වාර්ෂික විවේක දීමනාව (Annual Vacational Allowance) නොගෙවීමෙන් අසාධාරණයක් සිදුවී තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේනම් ඒ මහතාට හිමිවිය යුතු සහන කවරේද?'' යන්න පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 – 622

මගේ අංකය: IR/COM/05/2016/115.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2017.06.29 වැනි දින අංක 2025/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2017.06.22 වැනි දින දරන නියෝගයෙන්,

යූ. එම්. සී. එල්. ප්‍රනාන්දු මිය., අංක 91/10, ශාන්ත පීටර් පාර, මොරටුව.

සහ

හොංකොං ඇන්ඩ් ෂැන්හයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් (ශ්‍රී ලංකා),
අංක 24, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.

අතර පවත්නා 2017.06.22 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එස්. කාරියවසම් මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2017.06.22 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය.

2020 මාර්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

07 – 623/1

---

මගේ අංකය: IR/COM/05/2016/115.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

යූ. එම්. සී. එල්. ප්‍රනාන්දු මිය., අංක 91/10, ශාන්ත පීටර් පාර, මොරටුව.

සහ

හොංකොං ඇන්ඩ් ෂැන්හයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් (ශ්‍රී ලංකා),
අංක 24, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 05, ටොරින්ටන් මාවත, ටොරින්ටන් ෆ්ලැට්ස්, අංක K 77, පී. මහාදේව මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය.

2020 මාර්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2016/115.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

යූ. එම්. සී. එල්. ප්‍රනාන්දු මිය., අංක 91/10, ශාන්ත පීටර් පාර, මොරටුව.

සහ

හොංකොං ඇන්ඩ් ෂැන්හයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් (ශ්‍රී ලංකා),
අංක 24, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''හොංකොං ඇන්ඩ් ෂැන්හයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් (ශ්‍රී ලංකා) ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරියක ලෙස සේවය කළ යූ. එම්. සී. එල්. ප්‍රනාන්දු නමැති සේවිකාවට ඇගේ සේවය අවසන් කිරීමේ දී, අදාළ ආයතනයේ ක්‍රියාත්මක වන “Defined Contribution Scheme” යටතේ විශ්‍රාමික දීමනාවක් ලබානොදීම යුක්තිසහගතද? එසේ නැත්නම් එම සේවිකාවට හිමිවිය යුතු සහනයන් කවරේද?''

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 – 623/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.